සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25 S I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

# First Term Test - Grade 13 - 2019

විභාග අංකය ............................

## ලංකා ඉතිහාසය I

කාලය පැය තුනයි.
අමතර කියවීම් කාලය මිනි. 10 යි.

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත සියලු ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමග අමුණා භාර දෙන්න.

### I කොටස

- අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

01. 1. සීහලවත්ථු 2. රසවාහිනිය 3. සද්ධර්මාලංකාරය
4. සද්ධර්මරත්නාවලිය 5. සමන්තපාසාදිකාව (.....)

02. 1. ක්වේරොස් 2. රොබට් නොක්ස් 3. මේජර් ඩේවි
4. එමර්සන් ටෙනන්ට් 5. ජෝන් ඩොයිලි (.....)

03. 1. වේළුසුමණ 2. ඵුස්සදේව 3. හල්ලුක
4. නන්දිමිත්‍ර 5. ගෝඨයිම්බර (.....)

04. 1. පාහියන්ගල 2. බුන්දල 3. බටදොඹලෙන
4. බෙලිලෙන 5. අලවලලෙන (.....)

05. 1. උත්තිය 2. ධාතුසේන 3. මහාසීව
4. සුරතිස්ස 5. අසේල (.....)

06. 1. වලගම්බා 2. මිත්සෙන් 3. වසභ
4. පළමුවන සේන 5. පස්වන මිහිඳු (.....)

07. 1. දෝවාරික 2. අදෙක 3. ගමික
4. අසිග්ගාහක 5. දණ්ඩනායක (.....)

08. 1. කල්පිටිය 2. ගාල්ල 3. මඩකලපුව
4. කොළඹ 5. දෙවුන්දර (.....)

09. 1. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ 2. ශ්‍රී විජය රාජසිංහ
3. කීර්ති ශ්‍රී රාජසිංහ 4. රාජාධි රාජසිංහ
5. ශ්‍රී වික්‍රම රාජසිංහ (.....)

10. 1. පෙඩ්රික් නෝර්ත් 2. එඩ්වඩ් බාන්ස් 3. විල්බර්ට් හෝර්ටන්
4. හෙන්රි වෝඩ් 5. හර්කියුලීස් රොබින්සන් (.....)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11. 1. පණ්ඩුවාසදේව - හද්දකච්චායනා
    2. වළගම්බා - සෝමා දේවි
    3. පළමුවන විජයබාහු - තිලෝක සුන්දරී
    4. වික්‍රමබාහු - ලීලාවතී
    5. නිශ්ශංකමල්ල - කළ්‍යාණවතී (.....)

12. 1. ඉළනාග - පළමුවරට දකුණු ඉන්දීය කුලී හමුදා රැගෙන ඒම
    2. වසභ - ලම්භකර්ණ පෙළපතේ ආරම්භක පාලකයා
    3. සිරි මේඝවර්ණ - ලංකාවට දන්ත ධාතුව වැඩම කරවීම
    4. දෙවන සේන - දකුණු ඉන්දියාව ආක්‍රමණය කිරීම
    5. පළමුවන මුගලන් - සීගිරියට රාජධානිය මාරු කිරීම (.....)

13. 1. 1617 ගිවිසුම - සෙනරත් රජු හා පෘතුගීසින්
    2. 1638 ගිවිසුම - දෙවන රාජසිංහ රජු හා ලන්දේසීන්
    3. 1766 ගිවිසුම - කීර්ති ශ්‍රී රාජසිංහ රජු හා ලන්දේසීන්
    4. 1796 ගිවිසුම - පෙඩ්රික් නෝර්ත් සහ පිළිමතලව්වේ මහ අධිකාරම
    5. 1815 ගිවිසුම - උඩරට රදළ ප්‍රධානීන් සහ රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා (.....)

14. 1. කොට්ටල් බද්ද - කාර්මික ශිල්පීන් පිළිබඳ කාර්යාංශය
    2. කින්නර බද්ද - විවීමේ කාර්යාංශය
    3. කුරුවේ බද්ද - කුරුඳු තැලීමේ කාර්යාංශය
    4. මඩිගේ බද්ද - ප්‍රවාහන කාර්යාංශය
    5. බඩහැල බද්ද - කුඹල් කාර්යාංශය (.....)

15. 1. 8 වන වීර පරාක්‍රමබාහු - පෘතුගීසින් ලංකාවට පැමිණීම
    2. 6 වන විජයබාහු - විජයබා කොල්ලය
    3. කරලියද්දේ බණ්ඩාර - සීතාවක රාජසිංහ උඩරට අත්පත්කර ගැනීම
    4. පළමුවන සංකිලි - පෘතුගීසින් යාපනය යටත් කර ගැනීම
    5. රාජාධි රාජසිංහ - මුහුදුබඩ පළාත් ඉංග්‍රීසින් සතු වීම. (.....)

- අංක 16 සිට 20 තෙක් වූ ප්‍රශ්නය සඳහා නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් **x** හා **y** තීරුවල දී ඇත. **y** තීරුවේ දී ඇති නාම/ දින වකවානු **x** තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. **y** තීරුව, **x** තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දැක්වෙන සංයෝග පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | පණ්ඩුකාභය | A | නාච්චදූව |
| 2. | දේවානම්පියතිස්ස | B | යෝධ වැව |
| 3. | මහසෙන් | C | තිසා වැව |
| 4. | ධාතුසේන | D | අභය වැව |
| 5. | දෙවන මොග්ගල්ලාන | E | හුරුළු වැව |

1. BCEDA  2. BCDAE  3. BEACD  4. DCEBA  5. DCAEB (.....)

17. **X** **Y**

| | X | | Y |
|---|---|---|---|
| 1. | පළමුවන විජයබාහු | A | යාපහුව රාජධානිය |
| 2. | තුන්වන විජයබාහු | B | කුරුණෑගල රාජධානිය |
| 3. | පළමුවන බුවනෙකබාහු | C | පොළොන්නරු රාජධානිය |
| 4. | දෙවන බුවනෙකබාහු | D | ගම්පොළ රාජධානිය |
| 5. | හතරවන බුවනෙකබාහු | E | දඹදෙනිය රාජධානිය |

1. CEABD 2. CEADB 3. CAEAD 4. ACEBD 5. EBADC (.....)

18.

| | X | | Y |
|---|---|---|---|
| 1. | අල්පොන්සු පෙරෙයිරා ලසර්දා | A | ගන්නෝරුව සටන |
| 2. | පේද්‍රෝ ලෝපේස් ද සූසා | B | බලන සටන |
| 3. | දොන් ජෙරනිමෝ ද අසවේදු | C | රන්දෙනිවෙල සටන |
| 4. | කොන්ස්තන්තීනු ද සා | D | දන්තුරේ සටන |
| 5. | දියොගු ද මේලෝ කැස්ට්‍රෝ | E | මුල්ලේරියාවෙලේ සටන |

1. EDBCA 2. EDCBA 3. EACBD 4. DBACE 5. DEBCA (.....)

19.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ටිකිරි කුමාරයා | A | දෙවන රාජසිංහ |
| 2. | සපුමල් කුමාරයා | B | කීර්ති ශ්‍රී රාජසිංහ |
| 3. | මහා ආස්ථාන කුමාරයා | C | පළමුවන රාජසිංහ |
| 4. | පන්සලේ කුමාරයා | D | ශ්‍රී වික්‍රම රාජසිංහ |
| 5. | කන්නසාමි කුමාරයා | E | හයවන බුවනෙකබාහු |

1. CEBAD 2. CEABD 3. CABDE 4. DAEBC 5. EACBD (.....)

20.

| | X | | Y |
|---|---|---|---|
| 1. | පළමුවන ගජබාහු | A | සේන |
| 2. | දෙවන සේන | B | කිත්ති නගරගිරි |
| 3. | හතරවන මිහිඳු | C | නීල |
| 4. | පළමුවන පරාක්‍රමබාහු | D | විජය සිඟු තාවුරුනා |
| 5. | නිශ්ශංකමල්ල | E | කුට්ඨක |

1. DEACB 2. ECABD 3. CEABD 4. CEADB 5. ECABD (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. ශ්‍රී ලංකාව තුළ බුදු දහම මුල් බැස ගැනීම.
    1. අශෝක අධිරාජයා හා දේවානම්පියතිස්ස රජු අතර තිබූ මිත්‍රත්වය ඉවහල් විය.
    2. අශෝක අධිරාජයා අනුගමනය කළ ධර්ම විජය ප්‍රතිපත්තිය හේතු වීම.
    3. බුදු දහමට රාජ්‍ය අනුග්‍රහය ලැබීම.
    4. ඒ වනවිට ශ්‍රී ලංකාව තුළ සංවිධානාත්මක ආගමක් නොවීම.
    5. ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට ගිය දූත පිරිස කළ ඉල්ලීමක් හේතු කොටගෙන මිහිඳු හිමියන් වැඩම කිරීම.(.....)

22. අනුරාධපුර රාජධානියේ පරිහානිය,
    1. අනුරාධපුර යුගයේ අවසාන කාලයේ දුර්වල පාලකයන් බලයට පත්වීම.
    2. රජ පෙළෙපත් අතර පැවති බල අරගලය.
    3. දකුණු ඉන්දීය කුලී හමුදා මෙරටට රැගෙන ඒම.
    4. සිංහල රජවරු ද්‍රවිඩ කුමාරිකාවන් විවාහ කර ගැනීම.
    5. යුද්ධ නිසා වාරි කර්මාන්තය බිඳවැටී කෘෂිකර්මාන්තය අඩාල වීම. (.....)

23. නිරිතදිග රාජධානි
   1. නිදහස් භූමි භාග මත නිර්මාණය වීම.
   2. කෙටිකලක් තුළ රාජධානි මාරුවීම.
   3. අනුරාධපුර රජ පෙළපත්වල කුමාරවරු විසින් ආරම්භ කිරීම.
   4. මහා පරිමාණ වාරි ක්‍රම බිහි නොවීම.
   5. බටහිර වෙරළ ආශ්‍රිතව වෙළඳාම දියුණු වීම. (.....)

24. යාපනය රාජධානිය
   1. විජය කුලංකෙ යාපනය රාජධානියේ ප්‍රථම පාලකයා වීම.
   2. යාපනයේ රජ පරපුර ආර්ය චක්‍රවර්තී ලෙස හැඳින්වීම.
   3. නල්ලූර් යාපනයේ ප්‍රධාන පාලන මධ්‍යස්ථානය වීම.
   4. 1619 දී පෘතුගීසින් යාපනය යටත් කර ගැනීම.
   5. ලන්දේසි පාලන සමයේ යාපනය තුළ රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත වීම. (.....)

25. පළමුවන විමලධර්මසූරිය රජතුමා,
   1. රජවීමට පෙර කොනප්පු බණ්ඩාර සහ අවුස්ත්‍රියාවේ දොන් ජුවන් ලෙස හැඳින්වීම.
   2. රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීමට කුසුමාසන දේවිය විවාහ කර ගැනීම.
   3. පේරාදෙණියේ වීරසුන්දර බණ්ඩාරගේ සහෝදරයා වීම.
   4. දන්ත ධාතූන් වහන්සේ මහනුවරට වැඩම කරවීම.
   5. දන්තුරේ හා බලන සටන්වලදී පෘතුගීසින් පරාජය කිරීම. (.....)

- **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති A, B, C හා D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

  A සහ B පමණක් නිවැරදිනම් 1 ද,

  B සහ C පමණක් නිවැරදිනම් 2 ද,

  C සහ D පමණක් නිවැරදිනම් 3 ද,

  A සහ C පමණක් නිවැරදිනම් 4 ද,

  ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිනම් 5 ද වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| A සහ B පමණක් නිවැරදිය | B සහ C පමණක් නිවැරදිය | C සහ D පමණක් නිවැරදිය | A සහ C පමණක් නිවැරදිය | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. පොළොන්නරුවේ චෝල පාලනය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේ ද ?
   A - ශ්‍රී ලංකාවේ උතුරු කොටස මුම්මඩි ශෝල මණ්ඩලම් ලෙස හැඳින්විණි.
   B - පොළොන්නරුව ජන නාථ මංගලම් ලෙස නම් කරන ලදි.
   C - චෝල අධිරාජ්‍යයාගේ පුත්‍රයා ලංකාවේ උතුරු කොටස පාලනය කළේය.
   D - චෝල පාලන සමයේ දෙමළ මහා සෑය නමින් ස්ථූපය තනවන ලදී. (.....)

27. රජරට ආර්ථිකය,
   A - කෘෂිකර්මාන්තය පදනම් කොටගෙන ආර්ථිකයක් පැවතුනි.
   B - කුඩා දිවයිනක්වීම නිසා වෙළඳාම පැවතුණේ සුළු වශයෙනි.
   C - කෘෂිකර්මාන්තයේ දියුණුවට වාරිමාර්ග දියුණුවද ඉවහල් විය.
   D - කර්මාන්ත ක්ෂේත්‍රය කෘෂි උපකරණ නිපදවීමට සීමා විය. (.....)

28. කෝට්ටේ රාජධානිය,

A - 6 වන පරාක්‍රමබාහු රජතුමා කෝට්ටේ රාජධානියේ ශ්‍රේෂ්ඨ පාලකයා විය.

B - 1521 විජයබා කොල්ලය හේතු කොටගෙන කෝට්ටේ රාජධානිය ප්‍රාදේශිය රාජධානි තුනකට බෙදී ගියේය.

C - ධර්මපාල රජතුමා තෑගි ඔප්පුවකින් කෝට්ටේ රාජධානිය පෘතුගාලයේ රජතුමාට පවරා දුන්නේය.

D - සීතාවක රාජසිංහ රජතුමා කෝට්ටේ රාජධානියේ ආරක්ෂකයා විය. (.....)

29. උඩරට රාජධානියේ සමාජ සංවිධානය,

A - රජතුමා රටේ සියලුම ඉඩම්වල හිමිකරු ලෙස පිලිගැනීම.

B - ඉඩම් අයිතිය හා භුක්තිය පදනම් කරගෙන රටවැසියා රජුට අවනත වීම.

C - කුල ක්‍රමය පදනම් කරගත් ග්‍රාමීය ස්වයංපෝෂිත ආර්ථිකය.

D - දීඝ විවාහ, බින්න විවාහ, එකගෙයි කෑම වශයෙන් විවාහ ක්‍රම තුනක් පැවතීම. (.....)

30. මුහුදුබඩ පළාත්වල පෘතුගීසි පාලනය,

A - කොමාන්ඩරි ක්‍රමය ආරම්භ කිරීම.

B - වෙළඳාම හා ආගමික පරමාර්ථ මුල් කරගෙන පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

C - කපිතාන් ජනරාල්වරයෙකු පාලන කටයුතු මෙහෙයවීම.

D - හැකිතාක් සාමකාමී පාලනයක් ගෙන යෑම මඟින් යුධ වියදම් අඩු කිරීම. (.....)

- **ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. මහනුවර රාජධානියේ සිරකරුවෙකුව සිටිමින් ලංකාව පිළිබඳව තොරතුරු ඇතුලත් එදා හෙලදිව කෘතිය ලියූ ඉංග්‍රීසි ජාතිකයා කවුද ?

1. ජෝන් ඩොයිලි 2. රොබට් නොක්ස් 3. තෝමස් ස්කිනර්
4. එමර්සන් ටෙනන්ට් 5. ජුවාම් රිබෙයිරෝ (.....)

32. ගාවුත කණු පිහිටුවා ඒවා මත මහජනතාවට තම පණිවිඩ ලියා තැබූ රජතුමා,

1. නිශ්ශංකමල්ල රජතුමා 2. පළමුවන විජයබාහු රජතුමා 3. මහා පරාක්‍රමබාහු රජතුමා
4. කල්‍යාණවතී රැජිණ 5. තුන්වන විජයබාහු රජතුමා (.....)

33. සිංහල සංඝය නැමැති කැරැල්ල ඇති වූයේ කිනම් රජ කෙනෙකුට එරෙහිව ද ?

1. පළමුවන විජයබාහු රජතුමා 2. නිශ්ශංකමල්ල රජතුමා 3. හයවන බුවනෙකබාහු රජතුමා
4. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා 5. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (.....)

34. ලන්දේසීන්ගේ පෙරදිග පාලන මධ්‍යස්ථානය පිහිටියේ,

1. ගෝව 2. මදුරාසිය 3. කල්කටාව
4. බොම්බාය 5. බතාවිය (.....)

35. උඩරට රාජධානිය අත්පත් කර ගැනීමට යුධමය ක්‍රියාමාර්ග වෙනුවට රාජ්‍ය තාන්ත්‍රික උපාය මාර්ග අනුගමනය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා,

1. ෆෙඩ්රික් නෝර්ත් 2. තෝමස් මේට්ලන්ඩ් 3. රොබට් බ්‍රවුන්රිග්
4. විල්බර්ට් හෝර්ටන් 5. එඩ්වඩ් බාන්ස් (.....)

- අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4, සහ 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර, පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|
| 36. පළමුවන විජයබාහු රජතුමා තම විදේශ ප්‍රතිපත්තිය විවාහ සබඳතා මඟින් ශක්තිමත් කළේය. | පළමුවන පරාක්‍රමබාහු රජතුමා සිය දොළොස්වන රාජ්‍ය වර්ෂයේ දී බුරුමය ආක්‍රමණය කළේය. (.....) |
| 37. 1803 දී අසාර්ථක වූ ඉංග්‍රීසින්ගේ උඩරට ආක්‍රමණය 1815 දී සාර්ථක කර ගැනීමට සමත් වූහ. | මහනුවර රාජධානිය තුළ වර්ධනය වී තිබූ සිංහල හා නායක්කර් ගැටුමත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ අදූරදර්ශී පාලනයත් ඉංග්‍රීසින්ට කිසිදු යුදමය ක්‍රියාමාර්ගයක් නොගෙනම උඩරට අත්සත් කරගැනීමට මඟ පෑදීය. (.....) |
| 38. දහ අටවන සියවසේ දී වැලිවිට සරණංකර හිමියන් උඩරටින් ඇරඹූ බෞද්ධ ප්‍රබෝධය පහතරට ප්‍රදේශවලටද ව්‍යාප්ත විය. | ශ්‍රී විජය රාජසිංහ රජතුමා සියම් දේශයෙන් උපසම්පදාව ගෙන ඒම මෙරට සියම් නිකාය බිහිවීමට හේතුවිය. (.....) |
| 39. පෘතුගීසිහු දේශීය පාලන ක්‍රමය කෙරෙහි ඇතිකරගත් සැකය නිසා දේශීය පාලන ක්‍රමය මුළුමනින්ම ප්‍රතික්ෂේප කළහ. | ලන්දේසිහු පැරිස් පාසල් ක්‍රමය හඳුන්වාදී පහත රට ප්‍රදේශවල අධ්‍යයනය දියුණු කලහ. (.....) |
| 40. ඉංග්‍රීසින්ගේ ඇඟ බද්ද 1797 පහතරට කැරැල්ලට බලපෑ ප්‍රධාන හේතුව විය. | පහතරට ප්‍රදේශවල පැතිරී ගිය කැරලිවලට බලපෑ හේතු පරීක්ෂා කිරීමට පත් කල මියුරන් කොමිසම ද්විත්ව පාලනය අහෝසි කිරීමට නිර්දේශ කළේය. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 25 | S | II |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 13 - 2019**

විභාග අංකය .............................

ලංකා ඉතිහාසය II

- අමතර කියවීමේ කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.
- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- B හා C කොටස්වලින් ප්‍රශ්න එක බැගින්වත් තෝරා ගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.

## A කොටස

01. ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| (i) වෙල්ලස්ස | (ii) මාතලේ | (iii) දඹදෙනිය | (iv) උතුරු පළාත |
| (v) අඹන් ගඟ | (vi) මීගමුව | (vii) හුරුළු වැව | (viii) මිහිහාගල් කන්ද |
| (ix) සීතාවක | (x) පෙඩ්රික් කොටුව | (xi) ගම්පොල | (xii) මඩකලපුව |

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 1 බැගිනි)

(ල. 12)

## B කොටස

02. ''මහසෙන් රාජ්‍ය සමයේ අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීම සඳහා මහා වංශය සුවිශේෂී දායකත්වයක් සපයයි.'' මහා වංශයේ ඇති වැදගත්කම පහත සඳහන් මාතෘකා ඔස්සේ සාකච්ඡා කරන්න.
   (i) කර්තෘත්වය හා රචිත කාලය (ල. 2)
   (ii) මහා වංශයෙහි සඳහන් ආගමික නොවන තොරතුරු (ල. 7)
   (iii) අභිලේඛන මූලාශ්‍රවලින් තොරතුරු සනාථ වීම. (ල. 7)

03. ''දුටුගැමුණු මහ රජතුමා සහ වට්ටගාමනී අභය රජතුමා ලංකා ඉතිහාසය තුළ අභියෝග ජයගෙන ශ්‍රේෂ්ඨත්වයට පත්වූ රජවරු දෙදෙනෙකි.
   (i) දුටුගැමුණු රජතුමා පළමුව රාජ්‍යත්වයට පත්වූයේ කිනම් රාජධානියක ද? (ල. 01)
   (ii) වට්ටගාමනී අභය රජතුමාගේ පියා නම් කරන්න. (ල. 01)
   (iii) ඉහත රජවරු දෙදෙනා විසින් බුදු දහමට ඉටු කරන ලද සුවිශේෂී සේවය අගයන්න. (ල. 08)
   (iv) දුටුගැමුණු සහ වට්ටගාමනී යන රජවරු මුහුණ දුන් අභියෝග විමසුමට ලක් කරමින් දේශපාලන වෙනස්කම් තුලනාත්මකව පැහැදිලි කරන්න. (ල. 08)

04. ''රජරට ශිෂ්ටාචාරයේ පදනම වාරි කර්මාන්තයයි.''

(i) පණ්ඩුකාභය රජතුමා විසින් තනවන ලද වැවක් සඳහන් කරන්න. (ල. 1)

(ii) රජරට මහ වැව් තැනීමේ පුරෝගාමී රජතුමා නම් කරන්න. (ල. 1)

(iii) ක්‍රි.පූ. තුන්වැනි සියවසේ සිට හයවෙනි සියවසේ අග භාගය දක්වා වාරි මාර්ග ක්‍රමය වර්ධනය වූ ආකාරය පහත සඳහන් ශීර්ෂ යටතේ සාකච්ඡා කරන්න.

i. රජරට සභ්‍යත්වය ගොඩ නැගීම කෙරෙහි වාරි කර්මාන්තයේ බලපෑම.

ii. වැව් හා ඇලමාර්ග තැනීමෙහිලා පුරෝගාමී වූ රජවරු (ල. 14)

05. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) මුල් ඓතිහාසික අවධියේ ජනාවාසවල ස්වරූපය.

(ii) සීගිරිය

(iii) රජරට ශිෂ්ටාචාරයේ පැවති නාවික තාක්‍ෂණය

(iv) රජරට චෝල පාලනය

## C කොටස

06. ''ලංකාවට පෘතුගීසින්ගේ පැමිණීම යුරෝපා යටත් විජිතයක්වීමේ මූලාරම්භක අවස්ථාව වේ.''

(i) පෘතුගීසින් පැමිණෙන විට ලංකාවේ පැවති රාජධානි තුන නම් කරන්න. (ල. 3)

(ii) ''විජයබා කොල්ලය'' නැමැති බල අරගලය පෘතුගීසින්ට කෝට්ටේ බලය තහවුරු කර ගැනීමට වාසිදායක වූ ආකාරය විමසන්න. (ල. 5)

(iii) පෘතුගීසින්ගේ ආර්ථික ප්‍රතිපත්තිය පැහැදිලි කරන්න. (ල. 8)

07. (i) මුල්වරට මහනුවර රාජ්‍යය ස්වාධීන රාජ්‍යයක් ලෙස ආරම්භ කල පාලකයා නම් කරන්න. (ල. 1)

(ii) මහනුවර රාජ්‍යයේ අවසන් සිංහල රජතුමා නම් කරන්න. (ල. 1)

(iii) මහනුවර රාජධානිය පාලනය කළ නායක වංශික රජවරු පිළිවෙලින් නම් කරන්න. (ල. 4)

(iv) මහනුවර රාජධානිය ශක්තිමත්ව ගොඩනැගීමට I විමලධර්මසූරිය රජතුමා ඉටුකළ සේවය විමසන්න. (ල. 10)

08. උඩරට රාජධානිය අත්පත් කරගැනීම බ්‍රිතාන්‍ය දේශපාලන අරමුණු ඉටුවීම කෙරෙහි උඩරට පාලකයින්ගේ ක්‍රියාකලාපය බලපෑ ආකාරය විවේචනාත්මකව පැහැදිලි කරන්න. (ල. 16)

09. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) යාපනය රාජධානිය

(ii) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ ආගමික සේවය

(iii) ලන්දේසීන් හා උඩරට රාජධානි අතර පැවති සබඳතා

(iv) 1818 ප්‍රථම නිදහස් අරගලය (එක් කොටසකට ලකුණු 8 බැගිනි)

## පළමු වාර පරීක්ෂණය - 2019
## ලංකා ඉතිහාසය - 13 ශ්‍රේණිය
### පිළිතුරු - I කොටස

| | | | |
|---|---|---|---|
| 1. 5 | 11. 4 | 21. 5 | 31. 5 |
| 2. 1 | 12. 5 | 22. 4 | 32. 1 |
| 3. 3 | 13. 4 | 23. 3 | 33. 3 |
| 4. 2 | 14. 3 | 24. 5 | 34. 5 |
| 5. 2 | 15. 4 | 25. 3 | 35. 2 |
| 6. 4 | 16. 4 | 26. 1 | 36. 2 |
| 7. 3 | 17. 1 | 27. 4 | 37. 5 |
| 8. 5 | 18. 1 | 28. 5 | 38. 1 |
| 9. 1 | 19. 2 | 29. 5 | 39. 3 |
| 10. 1 | 20. 3 | 30. 2 | 40. 4 |

### II කොටස

### A කොටස




### B කොටස

02. (i) මහා විහාරවාසී දීඝසන්ද පිරිවෙනේ මහානාම හිමි.
ක්‍රි.ව. 5 - 6 සියවස්වල ලියාවී තිබීම.

(ii) * මහා වංසයෙහි ඇතුළත් ආගමික නොවන තොරතුරු දේශපාලන, සමාජ හා සංස්කෘතික, ආර්ථික හා තාක්ෂණික වශයෙන් සාකච්ඡා කළ හැකි වීම.

**දේශපාලන තොරතුරු**

* මහසෙන් රාජ්‍ය සමය තෙක් අඛණ්ඩව ලියවී තිබීම.
* විදේශ ආක්‍රමණ පිළිබඳ තොරතුරු
* ආක්‍රමණවලට මුහුණ දුන් රජවරු, විමුක්ති සටන්, සෙනෙවිවරු පිළිබඳව සඳහන් වීම. (උදාහරණ අවශ්‍යයි.)
* ජනතාවගේ හිතසුව පිණිස රජවරු ඉටුකළ සේවා සඳහන් වීම.

**සමාජ හා සංස්කෘතික තොරතුරු**

* ලංකාවේ ජීවත් වූ විවිධ සමාජ කොටස්, ජන වර්ග පිළිබඳව සඳහන් වීම. (පණ්ඩුකාභය රජුගේ ආගමික තොරතුරුවලදීත් නගරය සැලසුම් කිරීමේදීත් හෙළිවන විවිධ ජන හා ආගමික කණ්ඩායම්)
* මහසෙන් රජු හා ධාතුසේන රජු වැව් තැනීමේදී ස්වදේශිකයන්ගේ යක්ෂ ගෝත්‍රිකයන්ගේ සහය ලබා ගැනීම.
* බුදුන්වහන්සේ ලංකාවට වැඩම කරනවිට යක්ෂ, නාග දේව වශයෙන් ජීවත් වූ ජනතාව.
* විවාහ මංගල උත්සව පැවති බව. (විජය පැමිණි රාත්‍රියේ යක්ෂ ගෝත්‍රිකයන්ගේ විවාහ උත්සව)
* පණ්ඩුකාභය රජුගේ විනෝද උත්සව.
* තිස්ස රජුගේ මුව දඩයම (දඩයම පැවති බව හා එය රාජකීය ක්‍රීඩාවක් වූ බව)

**කාලෝචිත තොරතුරු**

* ගොඩනැගිලි තාක්ෂණය (උදා : දුටු ගැමුණු රජුගේ රුවන්වැලි සෑයට මුල්ගල් තැබීමේ විස්තරය)
* වාරි තාක්ෂණය
* දාගැබ් ඉදි කිරීම. (ථූපාරාමය මුල්කාලයේ ඇත් බඳකට වඩා උස් නොවූ බව)
* වළගම්බා රජුගේ අභයගිරිය.
* මහසෙන් රජුගේ ජේතවනාරාමය.
* නව මහල් ලෝහමහා ප්‍රාසාදය. (ල. 7)

(iii) * අභිලේඛනවලින් තොරතුරු සනාථ වීම.
* ආගමික තොරතුරු සනාථ වීම.
* මහින්දාගමනය - මිහින්තලේ හා රජගල ශිලා ලිපිවලින් හෙළිවන කරුණු
* රජවරුන්ගේ ආගමික ඉදිකිරීම් සනාථ වීම.
* දේශපාලන හා පරිපාලන තොරතුරු සනාථ වීම.
  - මිහින්තලේ ලෙන් ලිපි මගින් උත්තිය රජු ගැන සනාථවීම.
  - රජගල ලිපි මගින් සද්ධාතිස්ස හා ලජ්ජිතිස්ස පිය පුතු රජවරු ගැන විමසීම
  - මහා රත්මලේ ලිපිය මගින් මහා චූලික මහානාග, කුටකණ්ණතිස්ස, මහාදාඨික මහානාග ලම්භකර්ණ පෙළපත.
  - වසභ රජුගේ දීර්ඝ පාලන සමය - වල්ලිපුරම්, පෙරිමියන්කුලම, තම්මැන්නාව, කාසිමොටෙයි ලිපි මඟින් තහවුරු වීම.
  - බුද්ධ පාරින්ද රජු පිළිබඳව - රුවන්වැලි සෑ ලිපිය
  - හතරවන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපිය.
  - ඇමතිවරු හා නිලධාරීන් පිළිබඳව තොරතුරු සනාථවීම.
  - පරමාකන්ද, කළුදිය පොකුණ, මිහින්තලේ, සිතුල් පව්ව, සංඛපාල, හබැස්ස (උපරජවරු) මෙම උදාහරණ මඟින් සනාථ කර තිබීම.

**ආර්ථික තොරතුරු සනාථ වීම**

* වෙළඳ ශ්‍රේණි - සැස්සේරුව ලිපිය
* විවිධ බදු වර්ග හා රේගු නීති - ගොඩවාය ලිපිය
* වෙළඳපළක නීති - හෝපිටිගමුව ලිපිය

මෙම කරුණුවලට උදාහරණ දක්වා තිබීම. (ල. 7)

03. (i) * මාගම රාජධානිය (ල. 1)

(ii) * සද්ධාතිස්ස රජතුමා (ල. 1)

(iii)* **දුටුගැමුණු රජතුමාගේ ශාසනික සේවය** - මහා විහාරයට වැඩිම දායකත්වය සැපයූ රජතුමා වීම.
* ලෝවාමහාපාය, රුවන්වැලි සෑය, මිරිසවැටිය ඉදිකිරීම.
* රුවන්වැලි සෑය ඉදි කිරීමේ දී ජාත්‍යාන්තර බෞද්ධ සම්මේලනයක් ලෙස බෞද්ධාගම ජාත්‍යන්තරව අගය කිරීම.

  උදා : මුල්ගල් තැබීමට විදෙස් රටවලින් භික්ෂූන් ගෙන්වීම, බුදු සසුනට කළ පරිත්‍යාග හා අනුග්‍රහය ලියා තිබීම,

  **වලගම්බා රජතුමාගේ ආගමික සේවාව.**
* ගල්ලෙන් පූජා කිරීම. (කටාරම් ලිපි)
* ප්‍රථම නිකාය භේදය ඇතිවීම.
* අභයගිරිය ඉදි කිරීම.
* ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම.
* බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම. (ල. 7)

(iv) **දුටුගැමුණු රජතුමා මුහුණ දුන් අභියෝග**
* ලක්දිව උතුරු දිග පැවති එළාර පාලනය.
* එළාරගේ ප්‍රතිරූපය නිසා යුදමය පියවර ගැනීම ප්‍රමාද වීම. (කාවන්තිස්ස රජුගේ මැදිහත්වීම)
* දීඝාභය හා සද්ධාතිස්ස ගේ ක්‍රියාකලාපය

**වට්ටගාමනී අභය රජු මුහුණ දුන් අභියෝග**

* සත්ද්‍රවිඩ ආක්‍රමණය. * රුහුණු(තීය) තිස්ස බමුණාගේ කැරැල්ල. * රුහුණට පසු බැසීම.
* දොළොස් අවුරුද්දක් තිස්සේ පැවති බැමිණිතියා සාගතය නිසා යුධ ව්‍යාපාර සැලසුම් කළ නොහැකිවීම.
* තනසීව ගේ ක්‍රියා කලාපය.
* කපිසීසගේ ඝාතනයෙන් හටගත් මත භේද. (ල. 7)

04. (i) අභය වැව (බසවක්කුලම) ජයවැව, ගාමනි වැව (එකක් ලියන්න) (ල. 1)

(ii) වසභ රජතුමා (ල. 1)

(iii)* වැව් බැම්ම * බිසෝ කොටුව * සොරොව්ව * සළපනාව (රළ පනාව)
* පිටවාන * ඇළමාර්ග * ඉස්වැටි (දක්වා දෙකක් විස්තර කර තිබිය යුතුය) (ල. 5)

(iv)* මුල් කාලයේ පැවති ගම් වැව හා බැඳුණ වැව් හිමිවරු සිටීම.
* පණ්ඩුකාභය රජු විසින් වැව් තැන වූ බව මහා වංසයේ සඳහන් වීම.
* ඉන් පසුව වාරි කර්මාන්තය රටේ පාලකයාගේ වගකීමක් බවට පත්වීම.
* මහසෙන් රජුගේ මහා විහාර විරෝධී ක්‍රියාකලාපය හමුවේ වුවද ජනතාව විසින් දේවත්වයට ඔසවා තැබීම වාරි කර්මාන්තය දියුණු වූ ආකාරය.
* රජවරුන්ගේ ශ්‍රේෂ්ඨත්වයට වැව් බැඳීමේ කාර්යය ඉවහල් වීම.
* දිවයිනේ වියළි කලාපය ආවරණය වන සේ පැතිරුණු වාරි කර්මාන්තය ජාලයක් ලෙස රජරට පුරා පැතිරීම.

* අනුරාධපුරය කේන්ද්‍රකරගත් සභ්‍යත්වය පොළොන්නරුවට ව්‍යාප්තවීම.
* දේවානම්පිය තිස්ස රජ සමයේ පුළුල් වූ වාරි කර්මාන්තය නාගරික අවශ්‍යතා සඳහා ද යොදා ගැනීම. උදා : තිසා වැව හා නුවර වැව.
* ක්‍රි.ව. පළමුවන සියවස වනවිට මහ වැව් තැනීමේ යුගය ආරම්භ වීම. බිසෝ කොටුව සොයා ගැනීමේ විශිෂ්ටත්වය.
* වසභ, මහසෙන්, ධාතුසේන, II මොග්ගල්ලාන, V අග්බෝ, II අග්බෝ
* ඇලමාර්ගවල බැස්ම (ල. 9)

05. (i) මුල ඓතිහාසික අවධියේ ජනාවාසවල ස්වරූපය.
* වාපි ගම් * කාර්යයන් හා වෘත්තීන් අනුව ගම් * ගම්වල සැලැස්ම

(ii) සීගිරිය
* පළමුවන කාශ්‍යප රජු විසින් 5වැනි සියවසේ දී ඉදි කළ බව සඳහන් වීම.
* සීගිරිය පිළිබඳව විවිධ මත පැවතීම. (උදා : බලකොටුවන් හා කලාගාරයක් වශයෙන් දැක්වීම)
* උද්‍යාන තාක්ෂණය. * ජල කළමනාකරණයේ සෞන්දර්යාත්මක බව (දිය අගල් හා ජල මල්)
* රජ මාලිගය. * සෝපාන පන්තිය * කැටපත් පවුර * වපසරිය
* වසර 18කදී කළ විශ්මිත ගොඩ නැගීම. * තවමත් පර්යේෂණයට බඳුන්වීම.

(iii) රජරට ශිෂ්ටාචාරයේ නාවික තාක්ෂණය
* ඉන්දියාවට දේවානම්පියතිස්ස රජුගේ දූතයින් යැවීම.
* රෝමයට ගිය දූතයින්.
* අභ්‍යන්තර අරගල හමුවේ ඉන්දියාවට රජවරු පලා යෑම.
* I ගජබාහු, II සේන සමයේ ඉන්දියාවට ආක්‍රමණ සිදු කිරීම.
* I විජයබාහු, I පරාක්‍රමබාහු වැනි රජවරු බුරුමය වැනි අග්නිදිග ආසියාතික රටවලට නෞකා යැවීම.
* I පරාක්‍රමබාහු රජුගේ බුරුම හා දකුණු ඉන්දීය ආක්‍රමණ.
* පරාක්‍රමබාහු රජගේ නැව් තැනීම පිළිබඳව ඇති වංසකතා තොරතුරු.
* නිශ්ශංකමල්ල රජු රාමේෂ්වරමට යෑම - මේ සඳහා නැව් යොදා ගැනීම පිළිබඳව කරුණු දැක්වීම.

(iv) රජරට චෝල පාලනය
* හමුදාමය ස්වරූපයක් ගැනීම.
* මුල් කාලයේ පීඩාකාරී වුවත් පසුව සාමාන්‍ය තත්ත්වයකට වෙනස් වීම.
* අධිරාජ්‍යා නමින් සාමන්තවරයකු සිටීම.
* සාමන්තවරයාට නිදහස්ව කටයුතු කළහැකි වීම.
* අවශ්‍ය අවස්ථාවකදී අධිරාජයා විසින් යුතු ආධාර ලබා දීම.
* හින්දු ආගම ව්‍යාප්ත කිරීම. උදාහරණ පොළොන්නරුවේ පිහිටා තිබෙන ශිව දේවාල සඳකඩ පහණින් ගව රූපය ඉවත් කිරීම.
* ලංකාවෙන් බඳු රැස්කර දකුණු ඉන්දියාවේ තන්ජෝර් වෙත යැවීම.
* ත්‍රිකුණාමලයේ වෙල්ගම් වෙහෙර ප්‍රතිසංස්කරණය කර රාජ රාජ පෙරුම්පල්ලි ලෙස නම් කිරීම. (එක් සටහනකට ලකුණු 8 බැගින්)

## C කොටස

06. (i) 1. කෝට්ටේ 2. මහනුවර 3. යාපනය (ල. 3)

(ii) * විජයබා කොල්ලය හේතු කොටගෙන කෝට්ටේ රාජධානිය සහෝදරයින් තිදෙනා අත බෙදී යෑම.
කෝට්ටේ - 7වන බුවනෙකබාහු
සීතාවක - මායදුන්නේ
රයිගම - මද්දුම බණ්ඩාර හෙවත් රයිගම බණ්ඩාර
* රයිගම බණ්ඩාරගේ මරණයෙන් පසුව රයිගම සීතාවකට ආඳා ගැනීම.
* බුවනෙකබාහු රජු සහෝදර මායාදුන්නේ ගේ බල ව්‍යාප්තියෙන් කලබලවීම.
* ආරක්‍ෂාවට පෘතුගීසින් කෙරෙහි විශ්වාසය තැබීම.
* මායාදුන්නේගේ පෘතුගීසි විරෝධි ප්‍රතිපත්තිය.
* 7වන බුවනෙකබාහු රජුට පුතුන් නොසිටීම නිසා මුණුබුරු ධර්මපාල කුමරු ඔටුන්න හිමි කුමරා ලෙස නම් කිරීම.
* ධර්මපාල කුමරුගේ ආරක්‍ෂාව පෘතුගීසින්ට පැවරීම.
* බුවනෙකබාහු රජුගේ මරණයෙන් පසුව ධර්මපාල කුමරු කුඩාකළ සිට පෘතුගීසි රූකඩයක් වීම.
* ධර්මපාල රජු කතෝලික ආගම වැළඳ ගැනීම හා කෝට්ටේ රාජධානිය තෑගි ඔප්පුවකින් පෘතුගාල රජුට පැවරීම. (ල. 5)

(iii)* ලංකාවේ කුළුබඩු වෙළෙඳාම තමන් සතු කර ගැනීමේ අරමුණ.
* ඉන්දියන් සාගරයේ අරාබි, චීන, මලබාර්, වෙළඳුන්ගේ බලය විනාශ කර ඒකාධිකාරයක් ගොඩ නගා ගැනීමට ක්‍රියා කිරීම.
* ආර්ථික කටයුතු මෙහෙයවීම කපිතාන් ජනරාල්වරයා විසින්ම සිදුකිරීම.
* ලාභ ලැබීමේ අරමුණින් ආක්‍රමණ සිදු කිරීම.
* දේශීය සමාජ ආර්ථික සංස්ථා යොදා ගැනීම.
උදා : බද්දේ කාර්යාංශය (මහ බද්ද), ඉඩම් භුක්ති ක්‍රමය, කුල ක්‍රමය (සලාගම් කුලය කුරුඳු තැලීම) අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය තමන්ට වාසිදායක ලෙස යොදා ගැනීම.
* කුරුඳු වගා නොකිරීම.
* කැළෑවල ඇති කුරුඳු අත්පත් කර ගැනීම.
* ඇත් දත්, ඇතුන්, පුවක්. මුතු, මැණික්, වෙළඳාමේ බලය අත්පත් කර ගැනීම.
* උඩරට රාජ්‍යය සමග වෙළඳ සබඳතා පවත්වාගෙන යෑම.
* කුරුඳු රැස් කිරීම මහ බද්දේ කපිතාන් නැමැති පෘතුග්‍රීසි නිලධාරියකුට පැවරී තිබීම. (ල. 8)

07. (i) සේනා සම්මත වික්‍රමබාහු (ල. 1)

(ii) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ (ල. 1)

(iii) ශ්‍රී විජය රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ, රාජාධි රාජසිංහ, ශ්‍රී වික්‍රම රාජසිංහ (ල. 4)

(iv)* දළදා මාළිගය ඉදිකිරීම.
* රත්නපුර දෙල්ගමුවේ සිට දන්තධාතුව වැඩමවා එහි තැන්පත් කර දන්ත ධාතුන්හන්සේගේ උරුමය මහනුවරට ලබාදීම.
* සීතාවක රාජසිංහ රජුට යටත්ව පැවති සමයේ ආඬිගුරුන් හට පවරා දී තිබුණු ශ්‍රී පාදය නැවත බෞද්ධයින් ලබාගැනීම.
* මහනුවර නගරයෙන් ශිව භක්තික ආඬිගුරුන් පලවා හැරීම.
* බුරුමයෙන් උපසම්පදාව ගෙන්වා නැවත උපසම්පදාව ඇති කිරීම.
* වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය.
* බෞද්ධ භික්‍ෂූන්ට මහනුවර රැකවරණ නගරයක් බවට පත් කිරීම.
* ආගමික උරුමය සමග දේශපාලනික වශයෙන් මහනුවර රාජධානිය ගොඩ නැගීම.
* පෘතුගීසි බලපෑම් අවම කිරීම හා පරාජය කිරීම.
* ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම.
* සිංහල බෞද්ධ උරුමය තහවුරු කිරීම. (ල. 10)

08. * සිංහල හා නායක්කාර් බල අරගලය.
* සිංහල රදළවරු නායක්කාර්වරුන්ට එරෙහිව බ්‍රිතාන්‍යයන් සමග කුමන්ත්‍රණය කිරීම.
* ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හා උඩරට සිංහල රඳළ ප්‍රධානීන් ගැටුම් ඇති කර ගැනීම.
* ජෝන් ඩොයිලිගේ රහසිගත කුමන්ත්‍රණවලට අභ්‍යන්තර අරගල වාසිදායක වීම. (ල. 16)

09. (i) යාපනය රාජධානිය

* යාපනය රාජධානිය 13 වැනි සියවසේ දී බිහි වූ බව.
* දකුණු ඉන්දියාවෙන් පැමිණි රජ පෙළපතක් පාලනය ගෙනයාම.
* නල්ලූර් අගනුවර වීම.
* 6 වැනි පරාක්‍රමබාහු රජ සමයේ කෝට්ටේ යටත්වීම.
* ආර්ය චක්‍රවර්තී පෙළපතේ රජවරු
* විජය කුලංකෙ ප්‍රථම පාලකයා වීම.
* ආර්ය චක්‍රවර්තී පාලකයින් 12 දෙනෙකු ගැන මූලාශ්‍රවල සඳහන් වීම.
* යාල්පාන වෛපවමාලෙයි, ශෙගරාජ ශේකරමාලෛ ප්‍රධාන මූලාශ්‍ර වීම.
* ගම්පොල රාජධානි සමයේ බලගතුව පැවතීම.
* ක්‍රි.ව. 1619 දී පෘතුගීසින් යටතට පත්වීම.

(ii)
* බුදු දහමට වැඩිම අනුග්‍රහය දැක්වූ නායක්කාර් වංශික රජතුමා වීම.
* උපසම්පදාව නැවත පිහිටුවීම.
* සියම් නිකායේ ආරම්භය.
* ශ්‍රී සරණංකර හිමියන්ට තනතුරු පිරි නැමීම.
* දේවාල පෙරහැරට දළඳා පෙරහැර එක් කිරීම.
* උඩරට සහ පහතරට වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම. (උදාහරණ සහිතව පිළිතුරු ලියා තිබිය යුතුය.)

(iii)
* ලන්දේසීන් හා උඩරට රාජධානිය අතර පැවති සබඳතා
* උඩරට රාජධානිය කෙරෙහි මිත්‍රශීලි පිළිවෙතක් අනුගමනය කිරීම.
* උඩරට රජවරුන්ට තෑගි බෝග යැවීම.
* රජවරුන්ට ආමන්ත්‍රණය කිරීමේදී දැක්වූ යටහත් පහත් භාවය.
* දුර්වල රජවරු කෙරෙහි ආක්‍රමණශීලි වීම.
* ඉංග්‍රීසින් සමඟ උඩරට රජවරු සබඳතා පැවැත්වීමට බාධා පැමිණවීම.
* 1766 ගිවිසුම මඟින් උඩරට රාජධානිය අවනත කර ගැනීම.

(iv) 1818 ප්‍රථම නිදහස් අරගලය.

* උඩරට ගිවිසුම කඩ කිරීම නිසා බ්‍රිතාන්‍යයන් කෙරෙහි ඇති වූ අවිශ්වාසය.
* රදළ ප්‍රධානීන්ගේ බලතල අඩුවීම
* දේශීය රාජ්‍යත්වය අහෝසි කිරීම
* ගිවිසුමේ 5 වන වගන්තිය කඩ කිරිම නිසා භික්ෂූන් කළකිරීමට පත්වීම
* ඉංග්‍රීසින් කිතුණුවන් වීම
* පැරණි දේශීය සම්ප්‍රදායන් කඩ කොට නිලතල පැවරීම වෙල්ලස්සේ මඩිගේ මුහන්දිරම් තනතුර පිළිබඳ ගැටළුව.
* රදළ ප්‍රධානීන් සටනට නායකත්වය දීම.
* මොල්ලිගොඩ හා එක්නැලිගොඩ ඉංග්‍රීසින්ට සහාය දීම.
* සටන දුර්වල වීම.
* 1818 ප්‍රකාශනය මගින් ඉංග්‍රීසි පාලනය ශක්තිමත් කර ගැනීම.

***(එක් සටහනකට ලකුණු 8 බැගින්)***


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440